# බළන්ගොඩ නගර සභාව
## 2019-10-08 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2019.10.08**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්. එච්. ඒ. කරුණාරත්න මිය

**01. පසුගිය සභාවේ සභා වාර්තාව හා සම්මත කිරීම.**

අද දින මහ සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගනිමින් 2019-10-08 වන දින මාසික මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කල ගරු සභාපතිතුමා, 2019-09-10 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් සභා වාර්තාව සභා සම්මත කිරීමට ප්‍රථම සභා වාර්තාවේ සංශෝධන ඉදිරිපත් කිරීම සුදුසු වන බව පැවසීය.

එහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා පවසා සිටියේ පවත්නා නීති රීති හා ව්‍යවස්ථාව පරිදි සභා වාර්තා සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමෙන් පසු සංශෝධන ඉදිරිපත් කිරීම කළ යුතු බවයි.

එහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් 2019-09-10 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මෙදින සභා වාර්තාව සඳහා සංශෝධන තිබේදැයි ගරු සභාපතිතුමන් විමසා සිටි අවස්ථාවේ දී අදහස් දක්වන ලද ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් සංශෝධනයන් ලෙස 04ඃ01ඃ03 යෝජනාවේ 03 වන ඡේදයේ "2020 වර්ෂය සඳහා මහජන පොළ ටෙන්ඩර් කිරීමේදී" ලෙස සටහන් වී ඇති බැවින් එය "2020 මහජන පොළ ආපන ශාලාව ටෙන්ඩර් කිරීමේදී" ලෙස වෙනස් විය යුතු බව පවසා සිටින ලදී.

**ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය පෙ.ව.10.30 ට පමණ සභාවෙන් පිටව යන ලදී.**

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා තම පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්වල සටහන්ව ඇති ගල්පොත්තාරාව ඉඩම ගල්පොත්ත ඉඩම ලෙසත්, කුමාරගම බෙත්ථාරාම විහාරස්ථාන මාර්ගය සංවර්ධනය කිරීම කුමාරගම බෙත්ථාරාම විහාරස්ථානය හා ආර්ථික සංවර්ධන නිළධාරි කාර්යාලය අතර මාර්ගය ලෙසත්, දුනුගහමඩල ප්‍රදේශයේ බාධාකාරි බැම්මක කොටසක් ඉදිකිරීම නොව දුනුගහමඩල ප්‍රදේශයේ බාධාකාරි බැම්ම ඉවත් කිරීම ලෙසත් වෙනස් විය යුතු බව පවසා සිටියේය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා, තම පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම් වල කෝපිවත්ත මාර්ගය වෙනුවට හුණු කුඹුර මාර්ගය ලෙස සංශෝධනය විය යුතු බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් සභාපතිතුමාගේ යෝජනා සියල්ල එකම මන්ත්‍රීවරයෙකු ස්ථිර කිරීම වෙනුවට එක් යෝජනාවක් එක් මන්ත්‍රීවරයෙකු වෙන වෙනම ස්ථිර කිරීම සුදුසු බව පවසන ලදී.

**ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව සභා වාර්තාව සභා සම්මත විය.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- 2015 ජනාධිපතිවරණයේදී ජනාධිපති රැස්වීම පැවැත්වීම සඳහා තමා හට කිසිදු ඉඩක් නොලැබුනු නමුත් එදා තිබූ පළිගන්නා හා වෛරී දේශපාලන සංස්කෘතිය වෙනස් කරමින් අද වන විට පක්ෂ භේදයකින් තොරව ඕනෑම පක්ෂයකට තම තමන්ගේ දේශපාලන රැස්වීම් පැවැත්වීම සඳහා අවශ්‍ය ස්ථානයන් ලබා දීමට කටයුතු කර ඇති බව ද එම අපේක්ෂකයාට නගර සභාවක් වශයෙන් දැක්විය හැකි උපරිම ගෞරවය ලබා දෙන බව ද පැවසීය.
- ඒකාකාරී රාජකාරී කටයුතුවලින් මිදී සුහදශීලිත්වය වර්ධනය කිරීම සඳහා කාර්ය මණ්ඩලයේ නිළධාරින් වෙනුවෙන් වාර්ෂිකව පැවැත්වෙන පුහුණු වැඩමුළුව 2019-10-24 වන දින පෙ.ව.08.00 සිට ප.ව.04.00 දක්වා කපුගල පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වෙන අතර ඒ සඳහා සියළුම ගරු මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වය අපේක්ෂා කරන බව පවසා සිටින ලදී.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම.**

- ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා අසනීප බැවින් නිවාඩු ලබා දෙන ලෙස ලිපියක් ඉදිරිපත් කර ඇති බැවින් එතුමාගේ නිවාඩු අනුමත කරන බව සභාව දැනුවත් කරන ලදී.
- පොදු වෙළෙඳසැල අංක 12,14,18 දරණ මාළු කඩ හිමියන් දැනට අවුරුදු 20 ක පමණ කාලයක සිට වෙළඳාම් කරමින් තම ජීවනෝපාය පවත්වාගෙන යන බව ද කඩ කාමර ටෙන්ඩර් කිරීම තුළින් ඔවුන්ට මෙම ස්ථාන අහිමි වී යා හැකි බැවින් අදාල ටෙන්ඩර් කිරීම් සිදු නොකරන ලෙස ද සඳහන් කරමින් පොදු වෙළෙඳසැල අංක 18 කඩ කාමර හිමි ප්‍රියන්ත මුතුමාල මහතා විසින් එවා තිබූ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

- 147/10, වැවවත්ත, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි ඊ.එස්.සුන්දරරාජ් මහතා විසින් තම නිවස ඉදිරිපිට කාණුව හා මාර්ගය කැඩී ඇති බැවින් එය සකස් කර දෙන ලෙස ඉල්ලා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.
- නගර සභාව වෙත පවරා ගත් බස්නැවතුම්පල පදික කඩයක් තමා හට ලබා දෙන ලෙස අංක 14, වීරසුන්දරාරාම මාවත, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි එස්.එස්.ගුණරත්න මහතා විසින් ඉල්ලා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගතකරන ලදී.
- බළන්ගොඩ බණ්ඩාරවෙල මාර්ගයේ අංක 147/2 දරණ බෝක්කුවට සම්බන්ධ කාණුව ඇතුලත තණකොළ වැවී ඇති හෙයින් ජලයත් සමග ගලා එන අපද්‍රව්‍ය ඒ තුල තැන්පත් වීමෙන් ජලය බැස යාම අවහිර වී ඇති අතර, මේ නිසා වර්ෂා කාලයේ දී විශාල ජල ප්‍රමාණයක් "සෝමාවාස" , ඇල්ලෙඅරාව, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි තිමිර පෙරේරා යන අයගේ ගෙවත්ත හරහා ගලා යාමෙන් පාරිසරික හා සෞඛ්‍ය ගැටළු රාශියක් ඇති වී ඇති බව සඳහන් කරමින් නිවැස්හිමියා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  මේ සම්බන්ධව අවුරුදු 14කට අධික කාලයක සිට අදාළ බලධාරින් දැනුවත් කල නමුත් එයට විසඳුමක් නොලැබුණු බවත්, විධිමත් කාණුවක් ඉදිකිරීමට හෝ නළයක් යෙදීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් එහි වැඩිදුරටත් සඳහන් විය.

**04. කල් දී ඇති ප්‍රශ්න**

***04:01 ගරු නාගරික මන්ත්‍රීනි තරංගනී සමරසේකර මැතිතුමිය***

04:01:01 මුගුණමලේ සුසාන භූමිය නගර සභාව වෙත පවරා ගැනීමේ වර්තමාන තත්වය කෙසේද?

ඒ අනුව මෙම ඉඩම නගර සභාව වෙත පවරා ගැනීමට අදාලව රු.10,000.00 ක මුදලක් ගෙවන ලෙස මධ්‍යම පරිසර අධිකාරිය විසින් ලිඛිතව දන්වා ඇති බැවින් ඊට අදාල වවුචරය සකසා අනුමැතියට ඉදිරිපත් කර ඇති බව වැඩිදුරටත් පැවසීය.

04:01:02 මුගුණමලේ මාර්ගයේ කුඹුරු ඉඩම් ගොඩකිරීම සම්බන්ධයෙන් වර්තමාන තත්වය කෙසේද?

ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා, දැනට ගොඩ කරන ලද කුඹුරු ඉඩම් පෙර පැවති තත්ත්වයට පත් කරන ලෙසට බුලත්ගම ගොවිජන සේවා ප්‍රාදේශීය නිළධාරි විසින් අදාල පාර්ශව දැනුවත් කිරීමට කටයුතු කර ඇති බව සභාව වෙත දන්වා ඇති බව පැවසීය.

**05. කල් දී ඇති යෝජනා**

***05.01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා***

05ඃ01ඃ01 බස්නැවතුම්පොළ අංක සී- 31 දරණ කඩකාමරයේ බදු අයිතිය වෙනස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

බස්නැවතුම්පොළ අංක සී- 31 දරණ කඩකාමරයේ බදු අයිතිය වෙනස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා ඉහත කඩ කාමරය බදු ගෙන ඇති සුනිල් අමරවංශ වෙරළුපිටිය මහතා විසින් එම කඩ කාමරය ජී.ඒ.සම්පත් මංජුල බණ්ඩාර යන අයට පැවරීමට එකග වී ඇති බැවින් පෙර ගෙවුම් (කී මනි) මුදලින් 25% ක මුදලක් අය කර ගරු ආණ්ඩුකාරතුමාගේ අවසරය ලබා ගනිමින් පැවරීම සුදුසු බව පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ02 විනෝද බදු පැනවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

විනෝද බදු පැනවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදඅතර ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා මෙතෙක් කල් සභා බල ප්‍රදේශය තුළ විනෝද බදු අය කරනු ලැබුව ද විනෝද බදු ආඥා පනත ප්‍රකාරව විධිමත්ව පනවා ගැනීමක් සිදු වී නොමැති බව ප්‍රකාශ කරන ලදී. එමෙන්ම 2009 වර්ෂයේ දී මේ සඳහා සභා අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගෙන තිබුණ ද එය විධිමත් පරිදි ගැසට් කිරීමේ කටයුතු ඉටු කර නොමැති බව ද මේ නිසා බදු අය කර ගැනීමේ දී විවිධාකාරවූ ගැටලු වලට මුහුණ පෑමට සිදුවන බැවින් මෙම බදු විධිමත්ව පනවා ගැනීමේ අවශ්‍යතාවයක් ඇති බව ද පැවසීය. ඒ අනුව පහත සඳහන් වන පරිදි බදු පැනවීම සිදුකිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

| | විනෝද බදු ප්‍රතිශතය |
|---|---|
| සිනමාහල්වලින් | 7.5% |
| අනෙකුත් විනෝද කටයුතු සඳහා ටිකට්පතක වටිනාකම රු.100.00 නොයික්මවන අවස්ථාවක | 20% |
| අනෙකුත් විනෝද කටයුතු සඳහා ටිකට්පතක වටිනාකම රු.100.00 ට වැඩි අවස්ථාවක | 25% |

මෙහිදී අදහස් දැක්වූ ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් අදහස් දක්වමින් විනෝද බදු පැනවීම සඳහා අද දින සභා අනුමැතිය ලබා ගත්තද අවශ්‍ය අවස්ථාවන්හිදී එනම්, පාසල් මඟින් සංදර්ශන,

සැණකෙළි හා චිත්‍රපටි ආදිය ඉදිරිපත් කරන අවස්ථාවන්හිදී විනෝද බදු වලින් නිදහස් කිරීමේ හැකියාව සභාවට තිබිය යුතු බව පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමන් අදහස් දක්වමින් ප්‍රකාශ කලේ විනෝදු බදු අයකිරීමේදී අවසාන තීන්දුව සභාව සතු විය යුතු බවයි.

**විරෝධතා නොමැති හෙයින් නගර සභා සීමාව තුළ විනෝද බදු පැනවීමට අදාලව ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:03 මස් කඩ ටෙන්ඩර් කිරීමේ කොන්දේසි සම්බන්ධයෙන් නැවත සලකා බැලීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

මස් කඩ ටෙන්ඩර් කිරීමේ කොන්දේසි සම්බන්ධයෙන් නැවත සලකා බැලීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද නමුත් එය කිසිදු මන්ත්‍රීවරයෙකු විසින් ස්ථිර නොකරන ලදී.

මේ පිළිබඳව අදහස් දැක්වූ ගරු සභාපතිතුමා පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගේ අංක ACLG 06/3/5 හා 2019.10.07 දිනැති ලිපියෙහි සඳහන් කරුණු සභාව වෙත ඉදිරිපත් කරන ලදී. එමගින් වෙනත් පළාත් පාලන ආයතන බල ප්‍රදේශයක සිට බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශයට ගවමස් ප්‍රවාහනය කිරීම හා විකිණීමෙහි පවතින නීත්‍යානුකුලභාවය සම්බන්ධයෙන් අංක E/87/2019/PCSP හා 2019.05.24 දිනැති ලිපියෙන් නීතිපති විසින් උපදෙස් ලබා දී තිබිය දීත් 2019.09.10 දිනැති මහ සභාවේ තීරණ අංක 04:01:02 මගින් පොදු වෙළෙඳසැල මස් කඩ ටෙන්ඩර් කිරීමේ දී බළන්ගොඩ ප්‍රදේශයේ ව්‍යාපාරිකයන් සඳහා අවස්ථාව ලබා දිය යුතු බවත්, වෙනත් ප්‍රදේශවල ව්‍යාපාරිකයන් සඳහා මෙම අවස්ථාව ලබා දීම අවාසි සහගත බවත් දක්වමින් සභා අනුමැතියක් ගැනීම ප්‍රසම්පාදන ක්‍රමවේදය අභියෝගයට ලක් කරන්නක් වන බව පෙන්වා දී ඇත. එමෙන්ම ප්‍රසම්පාදන ක්‍රියාවලිය සකස් වී ඇත්තේ රාජ්‍ය ආයතන වලට භාණ්ඩ හා සේවා ලබාදීමේ දී වැඩි පිරිසකට ඒ සඳහා සහභාගිත්වයක් ලබාදීමට හා විනිවිදභාවයක් ඇති කිරීමට වන බව එහි සඳහන්ව ඇති බවත්, ඉහත සභා තීරණය එක් පුද්ගලයෙකු සඳහා මෙම මස් කඩය ලබා දීමට වක්‍රාකාරව පිටුවහලක් වන නිසාවෙන් විගණනයට ලක්විය හැකි අතරම, මෙමගින් සභාවට සිදුවන මූල්‍යමය අලාභයට ගරු සභාපති ඇතුළු සමස්ථ මන්ත්‍රී මණ්ඩලයම වෙන් වෙන්ව හා සාමූහිකව අධිභාරයට ලක්වීමේ හැකියාවක් පවතින බව එම ලිපියෙහි වැඩිදුරටත් සඳහන් බව ගරු සභාපතිතුමා විසින් පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, පසුගිය වසරේ මස් කඩ ටෙන්ඩර් කරන අවස්ථාවේදී බල පැවැත්වූයේ මස් වෙළෙඳාම සම්බන්ධ සම්මත අතුරු ව්‍යවස්ථාව වන අතර එම අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව පිටස්තර ප්‍රදේශයකින් මස් ලබා ගැනීමට නීතිමය

ඉඩක් නොතිබුනු නමුත් මේ සම්බන්ධව පිටස්තර පාර්ශවයන්ගෙන් දැඩි විරෝධයක් එල්ල වූ බව පවසා සිටින ලදී. එබැවින් මේ වන විටත් නීතිපති විසින් ප්‍රාදේශිය සභාවලට පිටස්තර ප්‍රදේශයකින් මස් ප්‍රවාහනයට ලබා දී ඇති අවසරය නගර සභාවට අදාළ වන්නේද නැද්ද යන්න තහවුරු කර ගැනීම සඳහා නීතිපති උපදෙස් ලබා ගත් අතර, ඒ අනුව නීතිපති විසින් "වෙනත් බල ප්‍රදේශයක ඝාතක මඩුවේ ඝාතනය කල ගවයෙකුගේ මස් ප්‍රවාහනයට හා විකිණීමට බලපත්‍රයක් ලබා ගත යුතුය" යනුවෙන් මතයක් ප්‍රකාශ කර ඇති බව පවසන ලදී.

මෙහිදී අදහස් දැක්වූ **ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා** විසින් පසුගිය සභාවාරයේදී ඒකමතිකව සම්මත කරන ලද මෙම යෝජනාව නැවත වරක් සම්මත කිරීම අවශ්‍ය නොවන බව පැවසූ අතර සෑම කාරණයක් සඳහාම කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබා ගැනීමට මෙය කොමසාරිස් පාලනයක් ද යන්න විමසා සිටින ලදී.

එමෙන්ම සෑම කාරණයක් සඳහාම කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබා ගන්නේනම් මෙම සභාව පැවැත්වීමේ ඇති ප්‍රයෝජනය කුමක්දැයි විමසා සිටි ගරු උප සභාපතිතුමා යමක් පිළිබඳ තීරණය කිරීමේ අවසාන තීන්දුව සභාව සතු විය යුතු බව ද එබැවින් මෙම යෝජනාව ස්ථිර නොකරන බව ද පවසා සිටින ලදී.

වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු උප සභාපතිතුමා මෙම යෝජනාව සභාවට යොමු කිරීමට ප්‍රථම ගරු මන්ත්‍රීවරුන් සමඟ සාකච්ඡා කළ යුතුව තිබූ බවත්, මේ පිළිබඳව විමසීමට තමා පළාත් සභාව වෙත ගිය බවත් පැවසූ අතර, වෙනත් අයකුගේ අනිසි බලපෑමක් නිසා සහකාර කොමසාරිස්තුමා මෙම ලිපිය එවා ඇති නමුත් ආදායමට වඩා අපේ කම ආරක්ෂා කරමින් වැඩ කළ යුතු බවත් පැවසීය. එමෙන්ම සභාව විසින් මස් කඩ ටෙන්ඩරය පිළිබඳ තීරණය ලබා ගැනීමේදී එක් පුද්ගලයෙකු නම් කර නොමැති බව ද බළන්ගොඩ නගර සීමාවෙන් පිටත ලබා දෙන්නේ නම් නගර සභා ආඥා පනත ප්‍රකාරව ඒ සඳහා අතුරු ව්‍යවස්ථාවක් සකස් කර ගැසට් කළ යුතු බව ද පැවසූ අතර, එසේ නොකර කොමසාරිස්තුමාට වුවද මේ පිළිබඳව තනි තීරණයක් ගත නොහැකි බව පැවසීය.

එමෙන්ම තමා මේ පිළිබඳව සෑම මන්ත්‍රීවරයෙකු සමඟ සාකච්ඡා කළ අතර ඒ අනුව මෙම ලිපිය ප්‍රතික්ෂේප කරන බවත්, මේ සඳහා පිළිතුරු සැපයීම අවශ්‍ය නොවන බවත් පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා** අදහස් දක්වමින් තමා දේශපාලනඥයෙකු වශයෙන් තම ඡන්දදායකයන් ආරක්ෂා කිරීමට කටයුතු කරන අතර

මෙම සභාව කොමසාරිස් පාලනය යටතේ පැවති අවුරුදු තුනක කාලයේදී ද මස් කඩ ටෙන්ඩර් කළේ බළන්ගොඩ නගර සීමාව තුළ පමණක් බව පවසන ලදී.

නැවත වරක් අදහස් දැක්වූ ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා පවසා සිටියේ සහකාර කොමසාරිස්තුමා අසත්‍ය තොරතුරු සැපයීම වැරැද්දක් බවයි. එබැවින් ලබන වසරේදී අවශ්‍ය වුවහොත් මේ පිළිබඳව තීරණයක් ගැනීම සුදුසු වන බවත්, සහකාර කොමසාරිස්තුමාගේ ලිපියෙහි අසත්‍ය තොරතුරු අඩංගුවීම නිසා මෙම යෝජනාව ඒකමතිකව ප්‍රතික්ෂේප කරන බවත් පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා** අදහස් දක්වමින් ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා මේ පිළිබඳව කරුණු ඉදිරිපත් කර සභාව දැනුවත් කිරීම සම්බන්ධව එතුමාට ස්තුතිවන්ත වන අතරම නීතිපතිතුමා මේ පිළිබඳව ඉදිරිපත් කර ඇත්තේද මතයක් පමණක් බව පැවසීය.

එමෙන්ම බළන්ගොඩ නගර සීමාව තුළ පිහිටි ගෝ ඝාතකාගාරයෙන් පමණක් මස් සපයා ගත යුතු බව මස් කඩ සම්බන්ධව පළ කර ඇති ගැසට් පත්‍රයේ සඳහන් කර ඇති අතර මේ දක්වා නගර සභා සීමාව තුළ පමණක් ටෙන්ඩර් කිරීම හේතුවෙන් ඒවාට අධිභාර අයවී ඇත්තේ කවදාදැයි විමසා සිටි ගරු මන්ත්‍රීතුමා එබැවින් මෙම යෝජනාව ඒකමතිකව ප්‍රතික්ෂේප කරන බව පවසා සිටින ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා 2020 වර්ෂය සඳහා හරක් මස් කඩ බළන්ගොඩ ගෝ ඝාතකාගාරයක් හිමි අයට පමණක් වන සේ සීමා යොදා ටෙන්ඩර් නිකුත් කිරීමට කටයුතු සිදු කරන බව පවසන ලදී.

05෴01෴04 2019 වර්ෂය තුල වැසිකිළි ආධාර ලබා දීමට තෝරා ගන්නා ලද අයගේ නාම ලේඛනය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

2019 වර්ෂය තුල වැසිකිළි ආධාර ලබා දීමට තෝරා ගන්නා ලද අයගේ නාම ලේඛනය සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා 2019 වර්ෂය සඳහා එක් මන්ත්‍රීවරයෙකු සඳහා රු.50,000.00 ක මුදලක් වැසිකිළි ආධාර වශයෙන් ලබා දෙන බව ද ඒ අනුව පහත නම් සඳහන් පුද්ගලයින් වැසිකිළි ආධාර ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබන බව ද පැවසීය.

| අනු අංකය | නම | ලිපිනය | |
|---|---|---|---|

| | | | |
|---|---|---|---|
| 01 | මනොලි ශානිකා ගුණසේකර | උඩ ඇල්ලෙපොල, බළන්ගොඩ. | ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 02 | ඒ.එස්.එම්.ෂමාහිල් | | ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා |
| 03 | චුල්ල මාධව | මහජන බැංකුව අසළ | ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 04 | ආර්.එම්.විජේරත්න | ඉහළ සඳුන්ගම, රාස්සගල, බළන්ගොඩ | ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 05 | නාලිකා ප්‍රියදර්ශනී | සියඹලාගහවත්ත, මෙගොඩ කිරිඳිගල, බළන්ගොඩ | ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 06 | එම්.නිලූෂා චන්ද්‍රමාලි පියරත්න | 62/ A, පුරණගෙදර පාර, ඕළුගංතොට, බළන්ගොඩ | ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 07 | එන්.එම්.ඉම්රාන් | 276, පහළ කිරිමැටිතැන්න, බළන්ගොඩ | ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 08 | බී.ජී.කරුණාරත්න | පරගහකුඹුර පාර, බෝම්බුව, බළන්ගොඩ | ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 09 | චාන්දනී කුමාරි වෙරළුපිටිය | ජනපද පාර | ගරු නාගරික මන්ත්‍රී එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 10 | සුබ්‍රමනියම් තිලෙ නල්ලම් | 54/15/ A , රාස්සගල පාර, සඳුන්ගම, බළන්ගොඩ | ගරු නාගරික මන්ත්‍රිනි එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 11 | චමීල් නුවන් ලියනගේ | ශෛලතලාරාම පාර, කිරිඳිගල, බළන්ගොඩ | ගරු නාගරික මන්ත්‍රිනි පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 12 | ප්‍රියන්ත කුමාර | කුමාරගම, බළන්ගොඩ | ගරු නාගරික මන්ත්‍රිනි එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 13 | කේ.එල්.එන්.පාලිත කුමාරසිරි | හුණුකුඹුර, ගාලවත්ත, බළන්ගොඩ | ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා |

| | | | |
|---|---|---|---|
| | | | මැතිතුමිය |
| 14 | පී.ඩබ්.ජයවික්‍රම | නො.150,පිරුවන පාර, කුමාරගම, බළන්ගොඩ. | ගරු නාගරික මන්ත්‍රි කේ. ජී. පේමදාස මැතිතුමා |
| 15 | ඒ.පද්මසිරි | 140/32, මැදගෙදර,රාස්සගල පාර, ලග්ගෙවෙල, බළන්ගොඩ | ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 16 | එච්.ඒ.මල්ලිකා | 20/24, පරණ පාර, බළන්ගොඩ | ගරු නාගරික මන්ත්‍රි එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 17 | එම්.ඩී.රොහාන් ඉන්දික | සරස්වතී පාර, උඩ ඇල්ලෙපොල, බළන්ගොඩ | ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා |

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතික සම්මත විය.**

05፥01፥04 බළන්ගොඩ නගර සභා කාර්යාලයේ මිදුල පූර්ව මිශ්‍රණය යොදා අළුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

බළන්ගොඩ නගර සභා කාර්යාලයේ මිදුල නගර සභා කම්කරුවන්ගේ සෘජු ශ්‍රමය යටතේ පූර්ව මිශ්‍රණය කර අළුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06. මන්ත්‍රි යෝජනා**

***06፡01 ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා***

06፡01፡01 බළන්ගොඩ දෙහිගස්තලාව තලාව පාර උඩ කොටස සම්පූර්ණයෙන්ම අබලන් වී ඇත. මෙම මාර්ගය කඩිනමින් අළුත්වැඩියා කිරීම.

06፥01፥02 බළන්ගොඩ කහටපිටිය පාර මුස්තාපා මාවත උඩ කොටස අබලන් වී ඇති කොටස අළුත්වැඩියා කිරීම.

06ඃ01ඃ03 බළන්ගොඩ ගොරොක්ගමහමඩ දුනුමඩලගහවත්ත මාර්ගය සහ මහ විද්‍යාලය වට රවුම පාර අබලන් වී ඇති කොටස අළුත්වැඩියා කිරීම.

ගරු නාගරික මන්ත්‍රී එම්,ජේ.මලීක්ෂා මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු උප සභාපති එම්,ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්,ජේ.මලීක්ෂා මැතිතුමන් අදහස් දක්වමින් මෙම සියළු මාර්ග නඩත්තු කටයුතු බැවින් මේ සඳහා ප්‍රමුඛස්ථානය ලබා දී කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

***06ඃ02 ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය***

06ඃ02ඃ01 තුඹගොඩ රාස්සගල පාරේ බස්නැවතුම්පල ස්ථාපනය කිරීමට කටයුතු කිරීම.

ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරක ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

***06ඃ03 ගරු නාගරික මන්ත්‍රිනි තරංගනී සමරසේකර මැතිතුමිය***

06ඃ03ඃ01 මුගුණමලේ දඹගහ නිවස අසල මාර්ගයේ ඇති අඹ ගස කපා ඉවත් කිරීම.

06ඃ03ඃ02 අනඳමෙත්ගම සිට දොරවෙල දක්වා වූ මාර්ගයේ ඇති ටෙලිකොම් සමාගමට අයත් වූ කණු මාර්ගයෙන් ඉවත් කිරීමට අදාළ ආයතන දැනුවත් කර මාර්ගයෙන් පිටුපසට දැමීමට කටයුතු කිරීම.

06ඃ03ඃ03 විදුලි බල මණ්ඩලය මගින් සිටුවා ඇති ලී කණු මාර්ගයේ මැද පිහිටා ඇති අතර එම ලී කණු දිරාපත් වී ඇති බැවින් එම කණු වෙනුවට කොන්ක්‍රීට් කණු යෙදවීමට කටයුතු කිරීම හා මෙම මාර්ගයේ ඇති විදුලි කණු මාර්ගයේ පසුපසට දැමීමට අදාල ආයතන දැනුවත් කිරීම.

06ඃ03ඃ04 අනඳමෙත්ගම ග්‍රාම නිළධාරි කාර්යාලය පිටුපස මාර්ගය සංවර්ධනය කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට අදහස් කරන බැවින් සිතියම්ගත වී ඇති මාර්ගයේ ප්‍රමාණය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් නිරවුල් කිරීමට කටයුතු කිරීම.

06ඃ03ඃ05 අනඳමෙත්ගම සිට මුගුණමලේ, දොරවෙල දක්වා වූ මාර්ගයේ නගර සභා අනුමැතියකින් තොරව කරන ඉදිකිරීම් වලින් මාර්ගය සංවර්ධනය කිරීමේදී ගැටළුවලට මුහුණපෑමට සිදුවන බැවින් අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් නීත්‍යානුකූල පියවර ගැනීමට කටයුතු කිරීම.

06ඃ03ඃ06 බුද්ධ ජයන්ති මාර්ගයේ සෙල්ලහේවා මහතාගේ නිවස පිටුපස ඇති නිවාස අසල දිරාපත්ව ඇති අන්තරාදායක විදුලි කණුව ඉවත් කිරීමට අදාළ ආයතන දැනුවත් කිරීම.

06ඃ03ඃ07 කිරිඳිගල ඩයමන්ඩ් උත්සව ශාලාව අසලින් ආරම්භ වන ශෛලතලාරාම විහාරස්ථානය දක්වා වූ මාර්ගය "ශෛලතලාරාම මාවත" ලෙස නම් කිරීම.

ගරු නාගරික මන්ත්‍රිනි තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රිනි තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් මුගුණමලේ දඹගහ නිවස අසල මාර්ගයට බාධාවක්ව පිහිටා ඇති අඹ ගස කපා ඉවත් කරන ලෙස පවසන ලදී.

එමෙන්ම 06ඃ03ඃ05 යෝජනාව පිළිබඳව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රීතුමිය නිවාස සැලසුම් අනුමත කිරීමේදී මාර්ගයේ අඩි 19 ක් ඉඩ තබා ඇත්දැයි පරීක්ෂා කරන නමුත් අනඳමෙත්ගම සිට මුගුණමලේ, දොරවෙල දක්වා වූ මාර්ගයේ නිවාස ඉදිකිරීම්වල දී අවශ්‍ය ඉඩකඩ නොතබා සිදු කර ඇති බැවින් නිවාස සැලසුම් අනුමත කිරීමේදී ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස පවසන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් රත්නපුර දිස්ත්‍රික් රථ වාහන කමිටුවේදී මාර්ගයේ ඇති ටෙලිකොම් කණු හා විදුලි කණු පිළිබඳව සාකච්ඡා කළ බවත්, එහිදී මේ පිළිබඳව ලිපියක් රථ වාහන කමිටුව මගින් රථ වාහන පොලීසියේ ස්ථානාධිපතිට යොමු කර නඩු පැවරිය හැකි බවට සඳහන් කළ බවත් පැවසීය.

මෙහිදී ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අදහස් දක්වමින් සභාවේ දී සාකච්ඡා කරන ගැටළු රථ වාහන කමිටුවට ඉදිරිපත් කිරීමත් රථ වාහන කමිටුවේදී සාකච්ඡා කරනු ලබන කරුණු සභාවට ඉදිරිපත් කිරීමත් පිළිබඳ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා වෙත ස්තුතිය පුද කර සිටින ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

***06:04 ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා***

06:04:01 උඩකන්ද ගල්වල පාර කොන්ක්‍රීට් කර ඇති කොටසෙහි කැඩී ගිය ස්ථාන අළුත්වැඩියා කර ගැනීම.

06:04:02 බෝම්බුව සේවා පියස තීන්ත ආලේප කරදීම සහ ග්‍රාම නිළධාරි කාර්යාලය සිවිලිම අලුත්වැඩියා කර දීම.

06෴04෴03 නිල්වලා ක්‍රිඩා පිටිය පිවිසුමෙහි ගැලවී ඇති කොන්ක්‍රීට් ගල් නිසි පරිදි සකසා දීම.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් උඩකන්ද ගල්වල මාර්ගයේ කොටසක් පමණක් අලුත්වැඩියා කර තිබෙන අතර ඉතිරි කොටස හැකි ඉක්මනින් අළුත්වැඩියා කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

එමෙන්ම බෝම්බුව සේවා පියස දුර්වර්ණ වී තිබෙන බැවින් එහි තීන්ත ආලේප කර එම ස්ථානයේ පවතින ග්‍රාම නිළධාරි කාර්යාලයේ ද සිවිලිම සකස් කර දෙන ලෙසත් නිල්වලා ක්‍රිඩා පිටිය පිවිසුමෙහි ස්ථාන කිහිපයක ගැලවී ඇති කොන්ක්‍රීට් ගල් නිසි පරිදි සකසා දෙන ලෙසත් ඉල්ලා සිටින ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

***06෴05 ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා***

06෴05෴01 ආගමික හා සංස්කෘතික කටයුතු සංවර්ධනය කිරීම යටතේ උඩ ඇල්ලෙපොල ශ්‍රී බෝධිමාලාකාරාම විහාරස්ථානයේ ඉදිකිරීම් සඳහා සිමෙන්ති මිටි 30ක් ලබා දීම.

ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා විසින් ඉදිරිපත් කර තිබූ ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය පෙ.ව.11.45ට පමණ නැවත සභාවට පැමිණීමෙන් අනතුරුව ඉහත 06:02:01 යටතේ සභා සම්මත වූ යෝජනාව පිළිබඳ අදහස් දක්වන ලදී.

මේ සම්බන්ධව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් අදහස් දක්වමින් තුඹගොඩ රාස්සගල පාරේ බස්නැවතුම්පල ස්ථාපනය කිරීම සඳහා තුඹගොඩ සාංඝිකාරාම විහාරස්ථාන භූමියෙන් ඉඩ ප්‍රමාණයක් ලබා ගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා අවසර ලබා ගැනීමට විහාරාධිකාරි හිමියන් සමඟ සාකච්ඡා කිරීමටත්, එහි දී උන්වහන්සේගේ අවසරය  නොලැබුණහොත් පාසල් දරුවන් ගැන සිතා කාණුව මත කොන්ක්‍රීට් ලෑලි යොදා ඒ මත ආවරණයක් ගැසීම සුදුසු බව පවසන ලදී. එමෙන්ම එහි වහලය ඉදිකිරීමට සම්පූර්ණ අනුග්‍රහය ලබා දීමට පුද්ගලයෙකු ඉදිරිපත් වී සිටින බවත්, මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් අවසර ලබාගනිමින් මෙය ඉදිකරන්නේනම් ඒ සඳහා වැඩි කාලයක් ගතවිය හැකි බවත් වැඩිදුරටත් පැවසීය.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා මෙම බස්නැවතුම්පල ඉදිකිරීමට විහාරාධිපති හිමියන්ගේ අවසරය ලබා ගන්නේනම් එය ඉදි කිරීමේ කටයුතු සිංහ සමාජය මඟින් සිදු කරනු ලබන බව පවසා සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා පවසා සිටියේ විහාරාධිපති හිමියන් සමඟ සාකච්ඡා කර සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසයි.

**07. හදිසි යෝජනා**

07:01 2020 වර්ෂය සඳහා පොදු වෙළෙඳසැල අංක 09/10 හැර ඉතිරි මාළු කඩ ටෙන්ඩර් කිරීම අත්හිටුවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

මෙදින මහ සභාවේදී පොදු වෙළෙඳසැල අංක 09/10 මාළු කඩ හැර ඉතිරි මාළු කඩ ටෙන්ඩර් කිරීම සඳහා බළන්ගොඩ නගර සභාව විසින් විවෘත ලංසු පත් කැඳවීමට විරුද්ධව සභාවේ විශාල විරෝධයක් එල්ල වූ බැවින් එම ලංසුපත් කැඳවීම අවලංගු කරමින් නැවත වරක් 2020 වර්ෂය සඳහා පොදු වෙළෙඳසැල අංක 09/10 හැර ඉතිරි මාළු කඩ ටෙන්ඩර් කිරීම අත්හිටුවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී **ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා** අදහස් දක්වමින් 2020 වර්ෂය සඳහා පොදු වෙළෙඳසැල මාළු කඩ ටෙන්ඩර් කිරීමේදී රු.10,000.00 ක මුදලක් අවම ලංසුව ලෙස ඉදිරිපත් කිරීම සඳහා ගරු සභාපතිතුමන් ගෙන ආ යෝජනාව තමා ස්ථිර කළ

නමුත් ටෙන්ඩර් කරන්නේනම් සියළුම මාළු කඩ ටෙන්ඩර් කරන ලෙසත්, එසේ නොමැතිනම් කිසිම මාළු කඩයක් ටෙන්ඩර් නොකරන ලෙසත් පැවසීය.

මෙහිදී අදහස් දැක්වූ **ගරු සභාපතිතුමා** පවසා සිටියේ පොදු වෙළෙඳසැල අංක 09/10 මාළු කඩ සඳහා ඔවුන් අධිකරණය මඟින් අතුරු තහනම් නියෝගයක් ලබා ගෙන ඇති බවයි. එමෙන්ම මේ සම්බන්ධව නීති උපදෙස් ලබා ගැනීම සඳහා නීති උපදේශක පාලිත අභයවර්ධන මැතිතුමා හමුවීමට ගිය අවස්ථාවේ දී එතුමා අතුරු තහනම් නියෝග ලබා ගත් වෙළෙඳසැල් හැර ඉතිරි වෙළෙඳසැල් සියල්ල ටෙන්ඩර් කළයුතු බව පැවසූ අතර ඉතිරි මාළු කඩ ටෙන්ඩර් නොකර සිටීමට නම් එම මාළු කඩ සඳහාද අතුරු තහනම් නියෝගයක් ලබා ගත යුතු බවත්, එසේ නොමැතිව ටෙන්ඩර් නොකර සිටීමෙන් විගණනයට ලක්ව අධිභාරයක් ගෙවීමට සිදුවන බවත් වැඩිදුරටත් පැවසීය.

මෙහිදී අදහස් දැක්වූ **ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා** පවසා සිටියේ පසුගිය මහ සභාවෙන් පසු නිතී උපදේශක මහතා හමුවීමට ගිය ද සභාවෙන් ගත් තීරණය වෙනස් කළ නොහැකි බවයි.

මෙහිදී **ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා** අදහස් දක්වමින් පියදාස ජයසේකර මහතා පොදු වෙළෙඳසැල අංක 09/10 කඩ කාමර සඳහා නඩුව ගොනු කර අවුරුදු 20 ක් වන බවත්, තමා සභාපති වශයෙන් සිටි සමයේදී මේ සම්බන්ධව පළාත් සභාවෙන් විමසූ අවස්ථාවේදී 09/10 කඩ කාමර හා ඉතිරි මාළු කඩ ටෙන්ඩර් නොකරන ලෙසට උපදෙස් ලබා දුන් බවත්, පොදු වෙළෙඳසැල අංක 09/10 කඩ කාමර හැර ඉතිරි මාළු කඩ ටෙන්ඩර් කිරීම තුළින් මාළු වෙළෙඳාම සඳහා ඒකාධිකාරයක් බිහි විය හැකි බවත් පවසන ලදී.

එමෙන්ම සභාවේදී ගනු ලබන තීන්දු වලංගු වන අතර, චක්‍රලේඛ අණපනත් ආදිය පවතින්නේ ආයතනය පාලනය කිරීම සඳහා බැවින් අවශ්‍ය නම් මේ සම්බන්ධව අතුරු ව්‍යවස්ථාවක් සකස් කළ හැකි බව සඳහන් කරන ලදී.

වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රීතුමා පොදු වෙළෙඳසැල අංක 9/10 මාළු කඩ කාමර ටෙන්ඩර් නොකර ඉතිරි මාළු කඩ ටෙන්ඩර් කිරීමෙන් 9/10 කඩ හිමියන්ට එය වාසිදායක වන බැවින් මෙම අවස්ථාවේදී මාළු කඩ ටෙන්ඩර් කිරීම නතර කර ආණ්ඩුකාරවරයාගේ උපදෙස් ලබා ගෙන පසුව ටෙන්ඩර් කිරීම සුදුසු බව පවසා සිටින ලදී.

**ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා** අදහස් දක්වමින් ගමේ ව්‍යාපාර ගමේ ජනතාව වෙත ලබා දියයුතු බව පවසා සිටි අතර පොදු වෙළෙඳසැල අංක 9/10 මාළු කඩ ටෙන්ඩර් නොකර ඉතිරි මාළු කඩ ටෙන්ඩර් කිරීම තුළින් ඕනෑම පුද්ගලයෙකුට

පහසුවෙන් ටෙන්ඩරය ලබා ගත හැකි බවත්, 9/10 මාළු කඩ නඩුව අවසන් වන තුරු ඔවුන්ට එම කාඩ කාමරයෙහි වෙළෙඳාම් කිරීමට හැකියාව ලැබෙන බවත් පැවසීය.

එබැවින් පොදු වෙලෙඳසැල අංක 9/10 මාළු කඩ කාමර ටෙන්ඩර් නොකරන්නේ නම් ඉතිරි මාළු කඩ කාමර ද ටෙන්ඩර් නොකරන ලෙසත්, අහිංසක මාළු වෙළෙන්ඳන් ණය වී තම ව්‍යාපාර පවත්වා ගෙන යන බැවින් ටෙන්ඩරය මඟින් ඔවුන්ගේ මාළු කඩ ඔවුන්ට අහිමි වී ගියහොත් එහි ශාපය සභාවට ලැබෙන බවත් පවසා සිටින ලදී.

එමෙන්ම නීති රීති කොතරම් පැවතිය ද සභාව වෙත බලවත් ශක්තියක් පවතින බැවින් සභාවෙන් යම් තීරණයක් ඒකමතිකව සම්මත කරගතහොත් එය ප්‍රමාණවත් බැවින් අධිභාරයක් අය කිරීමේ හැකියාවක් නොමැති අතර ගරු ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡා කිරීමෙන් පසු මාළු කඩ ටෙන්ඩර් කිරීම පිළිබඳ තීරණයක් ගැනීම සුදුසු බව පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා** අදහස් දක්වමින් පාර්ලිමේන්තුවේදී ද අවශ්‍ය අවස්ථාවන්හිදී නිතීරීති හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කර කටයුතු කරන්නේනම් අප සභාවට මේ පිළිබඳ තීරණයක් ගත නොහැක්කේ මන්දැයි විමසා සිටින ලදී.

එමෙන්ම 1999 වර්ෂයේ මහ සභා තීරණයක් පරිදි මාළු කඩ ටෙන්ඩර් කිරීමට අවසරය ලබා දී ඇති නමුත් එදා ඇමතිතුමා ලබා දුන් තීරණය මේ දක්වා වලංගු ද එය අපට වෙනස් කර ගත නොහැකි දැයි විමසා සිටි ගරු මන්ත්‍රීතුමා ලංකාවේ කිසිදු ස්ථානයක මාළු කඩ ටෙන්ඩර් කිරීමක් සිදු නොකර ඇති බව පවසා සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා 2020 වර්ෂය සඳහා පොදු වෙළඳසැල අංක 09/10 හැර ඉතිරි මාළු කඩ ටෙන්ඩර් කිරීම සඳහා පළ කල පුවත්පත් දැන්වීම අවලංගු කරමින් නැවත පත්තර දැන්වීමක් පළ කර ටෙන්ඩර් පත් නිකුත් කිරීම තාවකාලිකව නතර කරන බව පවසන ලදී. මේ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් ලද පසු සියළුම මාළු කඩ සම්බන්ධව තීරණයක් ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා ගෙන ආ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව **විරෝධතා නොවූ හෙයින් එම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08. කාරක සභා වාර්තා, කම්ටු වාර්තා සළකා බැලීම.**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | **9,342,063.61** |
| වෙනත් ලැබීම් | **8,695,561.98** |
| මුලු ලැබීම් | **18,037,625.59** |
| පුනරාවර්තන වියදම් | **8,533,559.92** |
| වෙනත් වියදම් | **6,276,453.15** |
| මුලු වියදම් | **14,810,013.07** |

**2019-09-01 සිට 2019-09-30 දක්වා ඉන්ධන වාර්තාව**

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 226-7521 | 20,800.00 |
| 227-5020 | 42,676.00 |
| | 795.00 |
| RD - 8240 | 30,710.00 |
| | 700.00 |
| 56-1906 | 8,320.00 |
| BC-0005 | 46,800.00 |
| DDR-0008 | 2,080.00 |
| RD-8000 | 5,200.00 |
| GC 0001 | 11,850.00 |
| LL - 7688 | 3,120.00 |
| HF - 8558 | 8,858.00 |
| GK-1483 | 9,360.00 |
| GK-6227 | 20,334.00 |
| JD-4684 | 2,760.00 |
| LL-2110 | 7,428.00 |
| ND-5124 | 35,048.00 |
| OS-0006 | 1,380.00 |
| PF-4006 | 31,644.00 |
| | 0.00 |
| FP - 0002 | 19,250.00 |
| DDP 0006 | 3,290.00 |
| QL-2901 | 5,520.00 |
| RC-1107 | 11,440.00 |
| RC-1118 | 26,000.00 |
| RC-8183 | 24,960.00 |
| RE-2600 | 34,320.00 |
| SDRR 0013 | 15,600.00 |
| UQ - 1933 | 4,140.00 |
| HF-7899 | 29,016.00 |
| MG0014 | 7,852.00 |
| YG-0758 | 2,070.00 |
| ZA - 5039 | 93,630.10 |
| **එකතුව** | **566,951.10** |

**මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**09. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

මෙහිදී 2019.08.22 දින හා 2019.09.05 දින පැවති මුදල් කමිටු වාර්තා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ ස්ථිරත්වයෙන් සභාවේ ඒකමතිකව සම්මත විය.

**10. පෞද්ගලික මන්ත්‍රි පැහැදිලි කිරීම්.**

**<u>ගරු නාගරික මන්ත්‍රී ජී.චන්ද්‍රලතා මැතිතුමිය</u>**

ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය පසුගිය සභා වාරයේදී කෝපිවත්ත මාර්ගයේ කාණුවක් සම්බන්ධව අධිකරණයෙන් ලැබුණු නඩු තීන්දුව තමා විසින් සභාවට ඉදිරිපත් කළ අතර, එම නඩු තීන්දුව මගින් අදාල කාණුව ශුද්ධ පවිත්‍ර කිරීමට සභාව වෙත සම්පුර්ණ බලතල පවරා තිබෙන බව පැවසීය. මෙම ස්ථානයට වැඩ අධිකාරිතුමා ගොස් පරීක්ෂා කිරීමේ දී එහි ඉඩම් හිමියා හා කුඹුරු හිමියා කාණුව ශුද්ධ පවිත්‍ර කිරීම සඳහා අකමැති වූ බව තමා හට දැනුම් දුන් බව පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමිය නඩු තීන්දුවක් මඟින් බලය පවරා තිබියදීත් මෙම කාණුව ශුද්ධ පවිත්‍ර නොකරන්නේ මන්දැයි විමසා සිටියාය.

එමෙන්ම පුද්ගලයින් කිහිප දෙනෙකු නිසා ගම් කිහිපයක ජනතාව අපහසුතාවයට පත්ව සිටින අතර ක්‍රමවත්ව ජලය බැස නොයාම නිසා ඒ අසල මාර්ගයද කැඩී ගොස් ඇති බව පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමිය සුදර්ශන ගම මාර්ගය ඉතිරි කොටස හැකි ඉක්මනින් පිළිසකර කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

මෙහිදී පිළිතුරු ලබා දුන් **ගරු සභාපතිතුමා** මෙම ස්ථානය පිළිසකර කිරීමට යාමේදී විශාල ගැටළුවක් ඇති වන බැවින් එහිදී නිළධාරීන් අපහසුතාවයට පත්වන බව ප්‍රකාශ කලේය. එබැවින් ගැටුමක් ඇති කර නොගනිමින් අදාළ පාර්ශව සමඟ සුහදව සාකච්ඡා කර මෙම කාණුව ශුද්ධ පවිත්‍ර කිරීම සුදුසු බව පැවසීය.

**<u>ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා</u>**

උඩ ඇල්ලෙපොල ශ්‍රී බෝධිමාලාකාරාම විහාරස්ථානයේ චෛත්‍යය ඉදිකිරීමේ කටයුතු අතරමග නැවතී තිබෙන බැවින් එම විහාරස්ථානය සඳහා සිමෙන්ති මිටි 30 ක් ලබා දෙන ලෙස ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා ගෙන ආ යෝජනාව හැකි ඉක්මනින් ඉටු කර දෙන ලෙස පැවසීය.

<u>**ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**</u>

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය සඳුන්ගම මාර්ගය අබලන් වී ඇති බැවින් එය පිලිසකර කර දෙන ලෙසත්, එම මාර්ගයේ කාණු පද්ධතිය හා විදුලි ප්‍රශ්න තිබෙන බැවින් ඒවා පිළිබඳවද අවධානය යොමු කරවන ලෙසත් පවසා සිටින ලදී.

<u>**ගරු නාගරික මන්ත්‍රිනි තරංගනී සමරසේකර මැතිතුමිය**</u>

මෙහිදී අදහස් දක්වමින් මාළු කඩ ටෙන්ඩර් කරන්නේ නම් සියළුම මාළු කඩ ටෙන්ඩර් කරන ලෙස පැවසූ ගරු මන්ත්‍රීතුමිය මාළු ගබඩා ටෙන්ඩර් නොකර මාළු කඩ පමණක් ටෙන්ඩර් කිරීමට හේතුව කුමක්දැයි විමසා සිටින ලදී.

එමෙන්ම මාළු ගබඩා ද මාළු කඩ වශයෙන් භාවිතා කරන බැවින් එසේ නොකිරීමට කුමක් හෝ ක්‍රමවේදයක් සකස් කරන ලෙස පවසා සිටින ලදී. මාළු කඩ සියල්ල ටෙන්ඩර් නොකර කිහිපයක් පමණක් ටෙන්ඩර් කිරීමෙන් මාළු වෙළෙඳුන් අසාධාරණයට ලක්වන බැවින් ටෙන්ඩර් කරන්නේ නම් සියළුම මාළු කඩ ටෙන්ඩර් කරන ලෙසත්, එසේ නොමැති නම් මුදලක් වැඩි කර ඔවුන් වෙතම එම කඩ ලබා දෙන ලෙසත් පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා ප.ව.12.00 ට පමණ සභාවෙන් පිටව යන ලදී.**

<u>**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**</u>

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් බෝම්බුව හුණුකුඹුර මාර්ගය යා කිරීම සඳහා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් පාලමක් ලබා දී තිබෙන අතර එම ස්ථානයට දොඹකර දෙකක් අවශ්‍ය බැවින් එය ගෙන ඒම සඳහා හුණුකුඹුර පැත්තෙන් තාවකාලික මාර්ගයක් සකසා දෙන ලෙස පවසා සිටින ලදී.

එමෙන්ම මෙම මාසය ජනාධිපතිවරණය පැවැත්වෙන මාසයක් බැවින් දේශපාලන පක්ෂ නියෝජිතයන් ලෙස සියළු මන්ත්‍රීවරුන් කාර්යබහුල වන බවත්, බළන්ගොඩ නගර සභාවේ මන්ත්‍රීවරුන් දේශපාලනික වශයෙන් කුමන මතක් දැරුවද මහජන සුභ සිද්ධිය උදෙසා කටයුතු කිරීම සුදුසු බවත් පවසන ලදී.

එමෙන්ම රටේ නායකයා තෝරාගැනීමට තම තමන්ගේ මතය විමසන මෙම අවස්ථාවේදී නිවැරදි මතය තෝර ගන්නා ලෙස පැවසූ ගරු මන්ත්‍රීතුමා සෑම

මන්ත්‍රීවරයෙකු සඳහාම තම තමන්ගේ දේශපාලන කටයුතු සාර්ථකව ඉටු කිරීමට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය 12.05 ට පමණ සභාවෙන් පිටව යන ලදී.**

**<u>ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් වීරසුන්දරාරාම මාවතේ කුමාර විද්‍යාලය අසළ සිට වැන් පාර්ක් එක දක්වා ඇති කාණුවේ කොටසක් කොන්ක්‍රීට් කර තිබෙන අතර ඉතිරි කොටසේ කාණුව ඉතා ගැඹුර බැවින් එම ප්‍රමාණයද කොන්ක්‍රීට් කර දෙන ලෙස පවසන ලදී.

එමෙන්ම ආපදා අවස්ථාවන්හි දී ගිනි නිවන රථයට අවශ්‍ය ජලය ලබා ගැනීම සඳහා බොහෝ දුර ගමන් කිරිමට සිදු වන බැවින් ජලය ලබා ගැනීම සඳහා ස්ථාන කිහිපයක් ස්ථාපනය කර දෙන ලෙස ජල සම්පත් මණ්ඩලයට ලිඛිත ඉල්ලීමක් කරන ලෙස වැඩිදුරටත් පැවසීය.

මීට අමතරව පිළිගත් වෙළෙඳසැල් සඳහා කුඩා ගිනි නිවන උපකරණයක් සවි කිරීමට නිර්දේශ කිරීමත් එසේ සවි නොකරන වෙළඳසැල්වල වෙළෙඳ බලපත්‍රය අත්හිටුවීමටත්, ලබන වසරේ වෙළෙඳ බලපත්‍ර ලබා දීමේ දී වෙළෙඳ සංගමය සමග සම්බන්ධ වී ලබා දීමට කටයුතු කරන ලෙසත් පවසා සිටින ලදී.

පොලිසිය අසල මාර්ගයේ කොන්ක්‍රීට් ස්ලැබ් හා බුහාරි හෝටලය වට රවුමෙහි කොන්ක්‍රීට් ස්ලැබ් ඉතාම අවිධිමත් ලෙස සකස් කර ඇති බැවින් එම කොන්ක්‍රීට් ස්ලැබ් ප්‍රමිතියකට අනුව සකස් කර දෙන ලෙස ද, තානායම් පිවිසුම් මාර්ගයේ One Way නාම පුවරුව සකස් කිරීම සඳහා වෙළෙඳ සංගමයට ලබා දෙන ලෙසද ඉල්ලා සිටින ලදී.

එමෙන්ම හිල්ව්ව් හෝටලය හා නව ලංකා හෝටලය අසළ කාණුව වර්ෂාව නිසා ශුද්ධ පවිත්‍ර වී ඇති බැවින් අවශ්‍ය පිළිසකර කිරීම් මෙම අවස්ථාවේ සිදු කර දෙන ලෙස ඉල්ලා සිටි ගරු නාගරික මන්ත්‍රීතුමා දේශබන්දු මහතාගේ නිවසට යන මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම පිළිබඳ ස්තුතිය පුද කරන ලදී.

තවදුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රීතුමා කුමන කොට්ඨාශයක හෝ සංවර්ධන කටයුත්තක් සිදු කිරීමේදී අදාළ කොට්ඨාශය භාර මන්ත්‍රීවරයා දැනුවත් කරන ලෙසත්, ලංකා බැංකුව අසළ සිට මහජන ක්‍රීඩාංගනය තෙක් ඇවිදින මංතීරුව හැකි ඉක්මනින් නිම කර දෙන ලෙසත් පවසා සිටින ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ප.ව.12.25 ට පමණ සභාවෙන් පිටව යන ලදී.**

එමෙන්ම බස්නැවතුම්පල හා මහජන පොළ අවට සුනඛ ගහනය වැඩි වී තිබෙන බැවින් ඩිපෝප්‍රොවේරා එන්නත ලබා දීමේ කටයුතුවල වර්තමාන තත්ත්වය මෙන්ම කසල ට්‍රැක්ටරය ගමන් කළ නොහැකි මාර්ගයන්හි ගමන් කිරීම සඳහා Truck රථයක් මිළදී ගැනීමේ වර්තමාන තත්ත්වය කෙසේදැයි විමසා සිටි ගරු මන්ත්‍රීතුමා පුස්තකාල කමිටුව මගින් ඉදිරිපත් කළ 'ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් වල එකතුව' සෑදීම සඳහා වැය වන රු.27,500.00 ක මුදල කඩිනමින් ලබා දෙන ලෙස පවසා සිටින ලදී.

එමෙන්ම දෙවට හරස් පාර ඉතා අබලන් තත්ත්වයක පවතින බැවින් එහි ගමන් කිරීමට හැකි වන සේ අඩි පාරක් හෝ සකස් කර දෙන ලෙස ඉල්ලා සිටිමින් ගරු මන්ත්‍රීතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

මෙහිදි අදහස් දැක්වූ ගරු සභාපතිතුමා පැවසුයේ වීරසුන්දරාරාම මාවතේ කාණු පද්ධතිය සඳහා අවශ්‍ය කොන්ක්‍රීට් ස්ලැබ් සකස් කර අවසන් බැවින් ඉතා ඉක්මනින් එම කාණු පද්ධතිය සාදා නිමකරන බවයි.

එමෙන්ම ඩිපෝප්‍රොවේරා එන්නත ලබා දීමේ සියළු බලතල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලය සතුවන බැවින් ඔවුන්ව මේ සම්බන්ධව දැනුවත් කිරීමට කටයුතු කරන බව වැඩිදුරටත් පැවසීය.

**<u>ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා</u>**

සුබයිර් අලීම් මාවත අබලන්ව ඇති බැවින් එය ප්‍රතිසංස්කරණය කරන ලෙස පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා මල් ප්‍රදර්ශන සඳහා පොළ භූමිය ලබා දෙන ලෙසත්, ඉදිරි ජනාධිපතිවරණයේදී සියලුම පක්ෂ සාමකාමීව මැතිවරණ කටයුතුවල නියැලෙන ලෙසත් පවසන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා</u>**

කිවුලවෙල පදිංචි ආර්.කේ.ගුණපාල මහතා පදික කඩයක් ඉල්ලා ලිපියක් ඉදිරිපත් කළ අතර එම මහතා හා ඔහුගේ බිරිඳ පදික වෙළෙඳම කරන අතරතුර සිදු වූ රිය අනතුරක් නිසා රෝගාතුරව සිටින බැවින් හැකියාවක් තිබේනම් ඔවුන් සඳහා බස්නැවතුම්පල පදික කඩයක් ලබා දෙන ලෙසත් ඒ සඳහා සභාවේ කිසිවෙකු විරුද්ධ නොවන බවත් පවසන ලදී.

එමෙන්ම 05ඃ01ඃ03 යෝජනාව ගරු සභාපතිතුමා සභාවට ඉදිරිපත් කළ අවස්ථාවේදී එම යෝජනාව කිසිවෙකු ස්ථිර නොකිරීම ඉතිහාසයේ කිසිදාක නොවූ විශේෂ සිදුවීමක් ලෙසත්, එම යෝජනාව සඳහා ගරු සභාපතිතුමාගේ පක්ෂයේ අයද විරුද්ධ වීම විශේෂත්වයක් බවත් පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා ඉහළින් පැමිණි නියෝගයක් සභාවට ඉදිරිපත් කිරීම සභාපතිතුමාගේ යුතුකමක් වන නමුත් එම යෝජනාව ස්ථිර නොකිරීම වෙනුවෙන් සභාවේ මන්ත්‍රීවරුන් සඳහා තම කෘතඥතාවය පළ කරන බව පවසන ලදී. එමෙන්ම මෙම යෝජනාව අසාධාරණ තීන්දුවක් වන අතර නගර සීමාව තුළ ගෝ ඝාතකාගාරයක් හිමි අයගෙන් පමණක් ටෙන්ඩර් පත් කැඳවීම නිසා මෙතෙක් කාලයක් කිසිදු ගැටළුවකට හෝ අධිභාරයකට ලක් නොවූ බැවින් මස් කඩ පිළිබඳ සාධාරණ තීන්දුවක් ලබා දෙන ලෙස පවසන ලදී.

එමෙන්ම මෙම සභාව පත් වී අවුරුදු දෙකක් පමණ ගතවීමට නියමිත නමුත් එම කාලය තුල අයවැයෙන් වෙන් වූ මුදල හැර වෙනත් කිසිදු ප්‍රතිපාදනයක් නොලැබුණ බව පැවසූ ගරු මන්ත්‍රීතුමා, ඉතිහාසයේ කවරදාකවත් නගර සභාවේ උප සභාපතිතුමාට සභාව තුල කාමරයක් අහිමිව නොතිබුණු නමුත් සභාව පත් වූ දා සිට මේ වන තෙක් උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන්ට කාමරයක් ලැබී නොමැති බව පවසන ලදී. මේ හේතුව නිසා සභාවට පැමිණෙන ඡන්ද දායකයන්ගේ අවශ්‍යතා ඉටු කිරීමට අපහසු තත්ත්වයක් පවතින බැවින් ගරු උප සභාපතිතුමාට නිල කාමරයක් අනිවාර්යයෙන් ලබා දෙන ලෙස පවසන ලදී.

ජනාධිපතිවරණය සඳහා ප්‍රධාන පක්ෂ තුනක අපේක්ෂකයන් ඉදිරිපත් වී තිබෙන අතර ඉන් ජනතා විමුක්ති පෙරමුණ වෙනස් ප්‍රතිපත්ති මාලාවක් ඉදිරිපත් කර තිබෙනු දැකිය හැකි නමුත් එක්සත් ජාතික පක්ෂයේ වෙනස් ප්‍රතිපත්තියක් දක්නට නොලැබෙන බව පැවසීය. එමෙන්ම පොදුජන පෙරමුණේ ජනාධිපති අපේක්ෂකයා ලෙස සම්ප්‍රදායික පක්ෂ අපේක්ෂකයෙක් නොවන පුද්ගලයෙක් ඉදිරිපත් වී තිබෙන බවත් ජනතාව විසින් රටට අවශ්‍ය කුමන නායකයෙකු ද යන වග තීන්දු කරනු ඇති බවත් වැඩිදුරටත් පැවසීය.

වැඩිදුරටත් අදහස් දක්වමින් ඉදිරි සභා වාරය ජනාධිපතිවරණයට පෙර දිනයක පවත්වන ලෙස ඉල්ලා සිටි අතර ගරු උප සභාපතිතුමා හා මන්ත්‍රී මණ්ඩලය සඳහා නිල කාමරයක් ලබා දීම පිළිබඳ මීට වඩා සැලකිලිමත් වන ලෙස පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේම කුමාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේම කුමාර මැතිතුමා අදහස් දක්වමින් මේ දිනවල ඇද හැලෙන අධික වර්ෂාපතනය සමඟ කිරිඳිගල, අනඳමෙත්ගම සිට ඕලුගංතොට රබර්වත්ත මාර්ගයෙහි නිහාල් මහතාගේ නිවස අසල හා ආරියදාස මහතාගේ නිවස

අසල පස් කන්දක් කඩා වැටී ඇති බව සඳහන් කළේය. මේ නිසා කාණුව අවහිර වී මාර්ගයෙහි ජලය ගලා යන බැවින් සභාවේ කම්කරුවන් යොදා එම කාණු පද්ධතිය පිළිසකර කර දෙන ලෙස පවසන ලදී.

එමෙන්ම ශෛලතලාරාම හන්දිය අසල සිදු කරමින් පැවති සංවර්ධන කටයුත්තක් අතරමඟ නතර කර තිබීම නිසා එහි ඇති කාණුවේ පස් පිරී ඇති අතර එම පස් ඉවත් කරන ලෙසත් කාණුව සංවර්ධනය කිරීමේ දී ඊට ඉහළින් ඇති නිවාස දෙක ආරක්ෂා වන පරිදි බැම්මක් යොදන ලෙසත් පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දක්වමින් මහජන පොළ වැසිකිළි පද්ධතිය ඉතාමත් අපිරිසිදු බැවින් එම වැසිකිළි පද්ධතිය පිළිසකර කර දෙන ලෙස පවසන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා</u>**

මෙහිදි අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රීතුමා පැවසුයේ ගරු උප සභාපතිතුමාට හා මන්ත්‍රී මණ්ඩලය සඳහා නිල කාමරයක් නොමැති වීමෙන් ජනතාවට සේවය සැපයීමේ කටයුතුවල දී අපහසුතාවයට පත් වන බවයි. එමෙන්ම නිලධාරීන් හා අංශ ප්‍රධානීන් හමුවීම සඳහා ඔවුන් වෙත යාමට සිදු වී ඇති අතර එමගින් නිලධාරීන් හා පාරිභෝගිකයන් යන දෙකොටසම අපහසුතාවයට පත්වන බව වැඩිදුරටත් පැවසීය.

එමෙන්ම 2019 වර්ෂයේ දී තමන් හට කිසිදු ප්‍රතිපාදනයක් නොලැබුණ බව පැවසූ ගරු මන්ත්‍රීතුමා ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකත්වය ලබා දෙන ලෙස තමා ලිඛිතව දැනුම්දුන් නමුත් එහි සාමාජිකත්වය ලබා ගැනීමට නොහැකි වූ බව පවසන ලදී.

එමෙන්ම උඩකන්ද මාර්ගයේ ඇති කාණු සඳහා ස්ලැබ් යෙදීමේ කර්මාන්තය අසාර්ථක බව කර්මාන්ත කමිටුවේ දී මෙන්ම සභාවේදී ද පෙන්වා දුන් නමුත් එම කර්මාන්තය තවමත් නිසි පරිදි අවසන් කර නොමැති බව සඳහන් කළ ගරු නාගරික මන්ත්‍රීතුමා මුදල් කමිටුවේ හා කර්මාන්ත කමිටුවේ කිසිදු ප්‍රගතියක් දක්නට නොලැබෙන බැවින් තමන් මුදල් කමිටුවෙන් හා කර්මාන්ත කමිටුවෙන් ඉල්ලා අස්වන බව පවසන ලදි.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා ප.ව.01.00 ට පමණ සභාවෙන් පිටව යන ලදී.**

හිටපු අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ දී මග නැගුම ව්‍යාපෘතිය යටතේ එක් මාර්ගයක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ලක්ෂ 10 බැගින් ලබා දුන් බව පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා අනියම් ආදේශක ගිවිසුම් හා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගත් අය ක්‍රියා පටිපාටියෙන් බැහැරව ස්ථිර කිරීමට හැකි වූ බව පවසන ලදී.

එමෙන්ම පසුගිය ජනාධිපතිවරණයේදී මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ රැස්වීම පැවැත්වීම සඳහා ක්‍රීඩා පිටිය ලබා නොදීම පිළිබඳ ගරු සභාපතිතුමාගේ චෝදනාව සම්බන්ධයෙන් අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රීතුමා ක්‍රීඩා පිටිය ලබා දීමට නොහැකි වූයේ ඊට පසුදින මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රැස්වීම පැවැත්වීමට කටයුතු යොදා තිබූ බැවින් ආරක්ෂක හේතූන් මත පදනම්ව බව පැවසීය. එමෙන්ම ජනාධිපතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා නගරය තුල පොලිතීන් භාවිත කිරීමට ඉඩ ලබා නොදිය යුතු අතර ජනාධිපති අපේක්ෂකයන්ගේ රැස්වීම් පැවැත්වෙන දිනයන්හි දී ප්‍රදර්ශනය කරනු ලබන බැනර් හා කටවුට් ඉවත් නොකරන ලෙස පවසන ලදී.

ජනාධිපතිවරණ මැතිවරණය සඳහා රාජ්‍ය දේපල අනිසි ලෙස භාවිත නොකරන ලෙස පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා මෙවර ජනාධිපතිවරණය සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පූර්ණ සහයෝගය පොදු ජන පෙරමුණට ලබාදෙන බව සඳහන් කළේය.

වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රීතුමා අක්කර 18 මාර්ගයේ දයා ගැරේජය අසල වංගුවේ ඇති කොන්ක්‍රීට් ස්ලැබ් එක කැඩී ඇති බැවින් එය සකස් කර දෙන ලෙසත්, බළන්ගොඩ නගර සීමාව තුල ඩෙංගු බෝවීමේ ප්‍රවණතාවය ඇති බැවින් ඒ පිළිබඳව සොයා බලන ලෙසත් පවසා සිටින ලදී.

දේශීය නිෂ්පාදන නගා සිටුවමින් කෘෂිකර්මාන්තය දියුණු කිරීම උදෙසා තිස් අවුරුදු යුද්ධය නිමා කල හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජයග්‍රහණය කරවීම වෙනුවෙන් තමන්ගේ පූර්ණ කැපවීම ලබා දෙන බවට පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**<u>ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා</u>**

මෙහිදී අදහස් දැක්වූ ගරු උප සභාපතිතුමා සභාව අවසන් වන තෙක් සභාවේ රැඳී සිටීම පිළිබඳව පොදු ජන එක්සත් සන්ධානයේ ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාට ස්තුතිය පළ කල අතර ගරු සභාපතිතුමා දේශපාලන ක්‍රියා සඳහා සභාවේ වාහන භාවිත නොකරන බව සඳහන් කළේය.

එමෙන්ම තමා ඇතුළු ගරු නාගරික මන්ත්‍රීවරුන් සඳහා නිල කාමරයක් නොමැති බැවින් සේවාලාභීන් වෙනුවෙන් වෙන් කර ඇති ස්ථානයේ වාඩි වී සිටීමට සිදුව ඇති බවත්, මේ නිසා මහජනතාව තමන්ව හමුවීමට පැමිණි අවස්ථාවන්හි දී ඔවුන්ගේ අවශ්‍යතාවය නිසි පරිදි ඉටු කර දීමට නොහැකි වී ඇති බවත් පවසන ලදී. මේ සම්බන්ධව වැඩිදුරටත් අදහස් දක් වූ ගරු උපසභාපතිතුමා පවසා සිටියේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ට සභාපතිතුමාගේ කාමරයේ රැඳී සිටීමට හැකි බැවින් අනිකුත් මන්ත්‍රීවරුන් සඳහා හෝ ස්ථානයක් සකස් කර ලබා දිය යුතු බවයි. එමෙන්ම

අද වන විට උප සභාපති හා ගරු නාගරික මන්ත්‍රීවරුන් සඳහා නිල කාමරයක් සකස් කර තිබීම පිළිබඳව සතුටු වන නමුත් සභා අයවැය ඉදිරිපත් කළ පසුව එම කාමරයට පැමිණෙන බව පවසන ලදී.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දක්වමින් මහජනතාවගේ ගැටලු සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා මන්ත්‍රීවරුන්ගේ නිවාසයන්හි ප්‍රමාණවත් ඉඩ පහසුකම් මෙන්ම කාර්ය මණ්ඩලයක් ද නොමැති බැවින් නිවෙස් වෙත මහජනතාව ගෙන්වා ගැනීම අපහසු බවත්, මහජනතාවගේ ගැටලු වලට ඇහුම්කන් දීම සඳහා නිල කාමරයක් අවශ්‍ය බවත් පවසන ලදී. එමෙන්ම මන්ත්‍රීවරුන් හමුවීමට මහජනතාව පැමිණෙන ඇතැම් අවස්ථාවල දී මන්ත්‍රීවරුන් සභාවේ නොමැති වීම හේතුවෙන් ඡන්ද දායකයන් වැරදි අදහස් ඇති කර ගත හැකි බව ද නගර සභාව මඟින් බොහෝ සංවර්ධනයන් සිදු කළ ද මන්ත්‍රීවරුන් සඳහා වෙන් වූ නිල කාමරයක් නොමැති වීම පිළිබඳව කණගාටුවට පත්වන බව ද වැඩිදුරටත් පැවසීය.

මෙවර ජනාධිපතිවරණයේ දී ජනාධිපතිවරණ අපේක්ෂකයන් ලෙස සුවිශේෂී පුද්ගලයන් ඉදිරිපත් වී ඇති බවත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ජනාධිපති අපේක්ෂකයෙක් ඉදිරිපත් නොකරන බැවින් පක්ෂයේ නියෝජිතයන් සමඟ මේ සම්බන්ධව සාකච්ඡා කළ අතර එහි දී එක්සත් ජාතික පක්ෂ විරෝධී සටනක් සිදු කරන නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පොදු ජන පෙරමුණ සමඟ එකතු වීමට තීරණය කළ බවත් පැවසීය.

ඒ අනුව ඒකීය බෞද්ධ රටක් තුල සාමයෙන් හා සෞභාග්‍යයෙන් ජීවත් වීමට සුදුසු පරිසරය සකස් කරමින් සියළුම ජාතීන්ට ජීවත්වීමේ අයිතිය ලබා දී අපේ රටට නිදහස ලබා දීමට කැප වූ ආදරණීය ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජයග්‍රහණය කරවීමට සහය දීමටත්, ඉදිරි දේශපාලන ගමන කිසිදු ගැටලුවක් නොමැතිව පවත්වාගෙන යාම සඳහාත් බළන්ගොඩ නගර සභාවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නාගරික මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් තීන්දුවක් ගත් බව පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු උපසභාපතිතුමා බළන්ගොඩ නගරයට පැමිණෙන දේශපාලන නායකයන්ට අවශ්‍ය ස්ථානයක් ලබා දීම හා ඔවුන්ට අවශ්‍ය ගෞරවය ලබා දෙන බවට ගරු සභාපතිතුමා සිදුකල සුවිශේෂී ප්‍රකාශය අගය කරන බව පැවසීය. මීට අමතරව කාර්යාලයේ සේවය සඳහා පැමිණෙන නවක නිළධාරින් හා මන්ත්‍රීවරුන් අතර සුහදතාවය වර්ධනය වීම සඳහා ඔවුන් සභාවට හඳුන්වා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ද සඳහන් කළේය.

බලන්ගොඩ නගර සභාවේ මහජන නියෝජිතයන් වශයෙන් අප සියලු දෙනා එකිනෙකා කෙරෙහි අපහාස අවලාද නොනගා අන් අයට ආදර්ශයක් වෙමින් කටයුතු කළ යුතු අතර ජනතා තීන්දුවට හිස නමා ගෞරව කරමින් ජයග්‍රහණය සමරමු යි යන්න සඳහන් කරමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

## 10. අවසානය

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා 2020 වර්ෂය සඳහා පොදු වෙළඳසැල මාළු කඩ ටෙන්ඩර් පත් නිකුත් කිරීම නතර කරන අතර හරක් මස් කඩ සඳහා බළන්ගොඩ ගෝ ඝාතකාගාරයක් හිමි අයට පමණක් වන සේ සීමා යොදා ටෙන්ඩර් පත් නිකුත් කිරීමට කටයුතු සිදු කරන බව පවසන ලදී.

එමෙන්ම ගරු මන්ත්‍රීවරුන් සඳහා ලබා දෙන ප්‍රතිපාදන සම්බන්ධව කරන ලද ප්‍රශ්න කිරීම් සඳහා පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පැවසූයේ 2002 වර්ෂයේදී බස්නැවතුම්පළ ඉදි කිරීම වෙනුවෙන් ලබා ගත් ණය වාරිකය නිසි පරිදි ගෙවා නොමැතිවීම හේතු කොට ගෙන මේ වන විට ඒ සඳහා එක් මසකට රු.1,000,000.00 ක මුදලක් සභාව මඟින් දැරීමට සිදුව ඇති බවයි. බස්නැවතුම්පල මගින් ලැබුණු ආදායම නිසි පරිදි ගිණුම් ගත කරමින් නියමිත පරිදි එම ණය වාරිකය ගෙවා තිබුණේනම් මෙම ණය මුදල මේ වන විට ගෙවා අවසන් බවත්, මෙය මෙවර අයවැයෙන් අපේක්ෂා නොකල වියදමක් බැවින් එය දැරීමට සිදු වීමෙන් නගරයේ පුරවැසියන් සඳහා දීය යුතුව තිබූ සහනය මෙන්ම ගරු මන්ත්‍රීවරුන් සඳහා දිය යුතුව තිබූ ප්‍රතිපාදන ලබාදීමට නොහැකි වූ බවත්, පසුගිය පාලකයින්ගේ අදුරදර්ශි ක්‍රියා හේතුවෙන් අද මෙම ප්‍රශ්නය උද්ගත වී ඇති බවත් වැඩිදුරටත් සඳහන් කළේය.

එමෙන්ම ගරු උප සභාපතිතුමා හා ගරු නාගරික මන්ත්‍රීවරුන් සඳහා නිල කාමරයක් ලබා දීමට මෙතෙක් කාලයක් ගතවීම සම්බන්ධව තමා කණගාටුවට පත්වන බව පැවසූ ගරු සභාපතිතුමා නගර සභා යාබද කාමරය ඉදි කිරීමේදී එයට බාධා වන ලෙස පෙත්සම් ඉදිරිපත් කරමින් සභාව අපහසුතාවයකට පත්කිරීම එයට හේතුව වූ බව සඳහන් කළේය. මේ නිසා එම කාමරය ඉදිකිරීමට වසරකට අධික කාලයක් ගතවූ අතර දැනට මාස 2 කට පෙර එය අවසන් කළ බව පැවසීය. එමෙන්ම මහජනතාවට අවශ්‍ය සේවාවන් සැපයීමේ දී නීත්‍යානුකූලව කටයුතු කළ යුතු අතර විගණන පනත සමග සභාව වගකීම් රාශියකට බැඳී ඇති බව පවසන ලදී.

සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ලබා දෙන බව පැවසූ ගරු සභාපතිතුමා නගරයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලබා ගැනීමට තමා විශාල කැප කිරීමක් සිදුකරන බව ද සඳහන් කළේය.

අතීතයේදී කළ හැකි සියලු නීති විරෝධී කටයුතු සිදු කර අද තමා හට නීති විරෝධී කටයුතු සිදු නොකරන්නැයි පැවසීම පිළිබඳ තමා කණගාටුවට පත්වන බවත් ඕනෑම අවස්ථාවක තමාගේ තනතුර හැර යා හැකි අතර පුද්ගලිකව හා දේශපාලනික වශයෙන්

මෙම ආයතනයේ කිසිම දෙයක් තමා නිතී විරෝධි අයුරින් භාවිතා නොකර ඇති බවද පවසන ලදී.

එමෙන්ම තමන් ජනතාවගෙන් දොස් අසන්නේ නීත්‍යානුකූලව කටයුතු කිරීම හේතුවෙන් බව ද  නීති විරෝධි ලෙස කටයුතු සිදු නොකර කිසිදු පුද්ගලයෙකුගෙන් බැනුම් ඇසීමට තමා සුදානම් නොමැති බව ද වැඩිදුරටත් පැවසීය.

එමෙන්ම ඕනෑම දේශපාලන පක්ෂයක රැස්වීම් සඳහා නගර සභාවක් වශයෙන් දිය හැකි උපරිම ගෞරවය ලබා දෙන බව පැවසූ ගරු සභාපතිතුමා අද දින සභාවට සහභාගි වූ ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු නාගරික මන්ත්‍රීවරුන් සියලු දෙනාට ස්තූතිය පුද කරමින් ප.ව.1.40 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.